# ඉඩම් මැනුම් සභාව
# நில அளவைச்சபை
## Land Survey Council

# 2013

# වාර්ෂික වාර්තාව
# ஆண்டறிக்கை
# ANNUAL REPORT

<u>පටුන</u>


| | | |
|---|---|---|
| 1. | සභාපතිගේ පණිවුඩය | 03 |
| 2. | දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය | 04 |
| 3. | ඉඩම් මැනුම් සභාවේ කාර්ය භාරයන් | 05 |
| 4. | ඉඩම් මැනුම් සභාවේ බලතල | 06 |
| 5. | ඉඩම් මැනුම් සභාවේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාව | 07 |
| 6. | ඉඩම් මැනුම් සභාවේ කාර්ය මණ්ඩලය | 08 |
| 7. | කාර්යයන් | 08 |
| 8. | අධ්‍යාපන සහ පුහුණු | 10 |
| 9. | මූල්‍ය මෙහෙයුම් සමාලෝචනය | 12 |
| 10. | අරමුදල් සහ මූල්‍ය කළමනාකරණය | 12 |
| 11. | 2013 වර්ෂය සඳහා වූ අවසන් ගිණුම් | 13 |
| i | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය | 14 |
| ii | මූල්‍ය කාර්ය සාධනය | 15 |
| iii | ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය | 16 |
| iv | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 17 |
| v | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්වලට අදාල සටහන් | 18 |
| vi | 2013-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා පොදු ගිණුම් ප්‍රතිපත්ති | 21 |
| 12. | විගණකාධිපති වාර්තාව | 22 |

# 01 සභාපතිගේ පණිවුඩය

සර්වේයර් ජනරාල් කාර්යාලය,
කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

2014 ජූනි මස 06 වන දින

තරඟකාරි ගෝලීය වෙළඳපොළ තුල ගුණාත්මක මෙන්ම වෘත්තිය නිපුනත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාභිගත වි වෘත්තිය පරිසරය ශක්තිමත් කිරිමේ අරමුණින් යුක්තව 2013 වසර තුලදීද ඉඩම් මැනුම් සභාව ක්‍රියා කර ඇති අතර සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ඉඩම් මැනුම් සභාව විසින් ඉටු කරන ලද කාර්ය භාරය පිළිබඳව මම බෙහෙවින් සතුටට පත්වෙමි.

2002 අංක 17 දරණ මැනුම් පනතෙහි විධිවිධාන පරිදි පිහිටුවා ඇති ඉඩම් මැනුම් සභාවේ ප්‍රධාන කාර්ය භාරයන් වනුයේ, මිනින්දෝරුවරුන් ලියාපදිංචි කිරීම, ලියාපදිංචි මිනින්දේරුවරුන් සඳහා වාර්ෂික වෘත්තියේ යෙදීමේ බලපත්‍ර නිකුත් කිරීම, මහජනතාව සඳහා මිනින්දෝරුවරුන්ගේ තොරතුරු ලබාදීම, මිනින්දෝරුවරුන්ගේ වෘත්තීමය විනය පවත්වාගෙන යාම, ඉඩම් මැනුම් සභාවට මහජනතාවගෙන් මිනින්දෝරුවරුන්ට එරෙහිව ලැබී ඇති පැමිණිලි විභාග කිරීම, සහ මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීම වේ.

ඉඩම් මැනුම් සභාව 2013 වර්ෂය සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් 1077 දෙනෙකුට වාර්ෂික මැනුම් බලපත්‍රය ලබා දෙන ලදී. තවද ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ට එරෙහිව සාමාන්‍ය ජනතාව මෙන්ම නොයෙකුත් ආයතන විසින් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන වෘත්තීය විෂමාචාරයන් පිළිබඳව පැමිණිලි සඳහා පරීක්ෂන 36 ක් 2013 වසර තුලදී සභාව විසින් පවත්වා අවසන් කර ඇත.

2013 වසරේදීද ලියාපදිංචි මිනින්දෝරුවරුන් අතරේ වෘත්තිමය විනය පවත්වා ගෙන යාම සහ ඔවුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය පිළිබඳව ඉඩම් මැනුම් සභාව බලවත් උනන්දුවක් දැක්වූ අතර 2013 වර්ෂය තුලදී ඉඩම් මැනුම් ක්ෂේත්‍රයට සම්බන්ධ වෘත්තීය සංවර්ධන පාඨමාලා 11 ක් ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවන් සඳහා ඉඩම් මැනුම් සභාවේ අනුමැතිය ඇතිව පවත්වන ලදී. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් අඛන්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා හැදැරිමට දැක්වූ දැඩි උනන්දුව කැපී පෙනුනු කරුණක් විය.

සමාලෝචිත කාලය තුල ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් පහසුවෙන් කරගෙන යාමට නොමසුරු සහයෝගය දැක්වූ ඉඩම් මැනුම් සභාවේ සාමාජිකයින්, වැඩ බලන ලේකම් හා කාර්ය මණ්ඩලය වෙත මගේ ස්තූතිය පුදකර සිටිමි.

පී. එම්. පී. උදයකාන්ත
සභාපති

# 02 දැක්ම හා මෙහෙවර

## දැක්ම

ඉඩම් මැනුම් සඳහා ක්‍රමවත් රාමුවක අඛන්ඩතාව පවත්වා ගනිමින් ජාතික සංවර්ධනය උදෙසා අපගේ භෞතික හා ස්වභාවික සම්පත් වල ප්‍රශස්ත හා තිරසාර උපයෝගිතාව තහවුරු කර ඒ තුළින් තරඟකාරි ගෝලීය වෙළඳපොළ තුල ගුණාත්මක මෙන්ම වෘත්තිය නිපුනත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාභිගත වි වෘත්තිය පරිසරය ශක්තිමත් කිරිම අපගේ දැක්මවේ.

## මෙහෙවර

මැනුම් වෘත්තිය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත් වෘත්තියෙන් බලාපොරොත්තු වන්නාවු තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන් වලට එකඟ වන ලෙස පුහුණුවක් හා අධ්‍යාපනයක් වෘත්තීයට ප්‍රවේශවන්නන් වෙත ලැබෙන බවටත් එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගනු ලබන බව තහවුරු කිරිම ඉඩම් මැනුම් සභාවේ මෙහෙවර වේ.

## 03 2002 අංක 17 දරණ මැනුම් පනතේ විධිවිධාන පරිදි ඉඩම් මැනුම් සභාවේ කාර්ය භාරයන්

2002 අංක 17 දරණ මැනුම් පනතේ විධිවිධාන පරිදි ඉඩම් මැනුම් සභාව 2003 වර්ෂයේදී පිහිටුවනු ලැබූ අතර එහි මෙහෙයුම් කටයුතු කොළඹ 05, කිරුළ පාරේ, අංක 150 දරණ ස්ථානයේ පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාලයේ පළමු මහලේදී ආරම්භ කරන ලදී.

උක්ත පනතේ 37 වන වගන්තියේ දක්වා ඇති පරිදි සභාවේ කාර්යයන් පහත පරිදිවේ.

(අ) ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්ය පටිපාටිය පවත්වා ගෙන යාම හා ඉඩම් මැනිමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තියමය විනය පවත්වාගෙන යාම;

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරිම සඳහා මිනින්දෝරුවන්ගෙන් ඉල්ලුම් පත්‍ර භාරගැනීම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනිමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද සහ හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හිදි ඔවුන් ලියාපදිංචි කිරිම;

(ඇ) වාර්ෂික වෘත්තියමය බලපත්‍ර නිකුත් කිරිම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත් භාර ගැනිම සහ එවැනි මිනින්දෝරුවන්ට ඉඩම් මැනිමේ වෘත්තිය කරගෙනයාම සඳහා දැනුම සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහිමකට පත්වන අවස්ථාවන්හිදී එවැනි බලපත්‍ර නිකුත් කිරිම;

(ඈ) ඉඩම් මැනිමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තියමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරිම;

(ඉ) මිනින්දෝරු වෘත්තියේ යෙදී සිටින හා වාර්ෂික වෘත්තියමය බලපත්‍ර ලබාගැනිමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩිදියුණු කිරිමේ කාර්ය සඳහා වෘත්තියමය සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරිම;

(ඊ) ඉඩම් මැනිම පිළිබඳ ශාස්ත්‍රිය හා වෘත්තියමය සුදුසුකම් පිළිගැනිම, ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරිම සහ ලියාපදිංචි මිනින්දෝරුවන් ලෙස ලියාපදිංචි වීමට සහ වාර්ෂික වෘත්තිමය බලපත්‍ර නිකුත් කිරිම සඳහා වූ අපේක්ෂකයන් වෙනුවෙන් සුදුසුකම් ලැබිමේ විභාග හා වෘත්තියමය සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම;

(උ) ඉඩම් මැනිමෙහි යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනිම යන කරුණු වලදී සම තත්වයක් හා අන්‍යෝන්‍යතාවයක් ස්ථාපිත කිරිම සඳහා විදේශීය රටවල බලධරයන් සමග අන්‍යෝන්‍ය වැඩ පිළිවෙලවල් සඳහා එකඟතාවය ඇතිකර ගැනිම හා ක්‍රියාත්මක කිරිම;

(ඌ) නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් තොරතුරු පිළිබඳව නියැලි සිටින ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරිම;

(එ) උසස් වෘත්තියමය ප්‍රමිතීන් පවත්වාගෙන යාමේදී ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ සංවිධාන සමග සම්බන්ධීකරණය කිරිම;

## 04 ඉඩම් මැනුම් සභාවේ බලතල

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ බද්දට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

(ආ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමට සහ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සඳහා ඒවා යොදා ගැනීම.

(ඇ) සභාවේ කටයුතු කරගෙන යාමට අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

(ඈ) එසේ පත්කරන ලද නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය තීරණය කිරීම.

(ඉ) ස්වකීය කර්තව්‍යයන් ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා කමිටු පත් කිරීම.

(ඊ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම හා සුභසාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීම.

(උ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් නීති සෑදීම.

(ඌ) සාමාන්‍යයෙන් සභාවේ කර්තව්‍ය නිසිපරිදි ඉටුකිරීම පහසු කරලීම සඳහා අවශ්‍යවන වෙනත් සියලු දේ කිරීම.

## 05 2013 වසර තුළ ඉඩම් මැනුම් සභාවේ කාර්යසාධනය පිළිබඳ වාර්තාව

**2013 දෙසැම්බර් 31 වන දිනට ඉඩම් මැනුම් සභා සාමාජිකයන්:**

| | | |
|---|---|---|
| i. | ආචාර්ය කේ.තවලිංගම් මයා | - සභාපති |
| ii. | නිහාල් ගුණවර්ධන මයා | - උප සභාපති |
| iii. | එස්. ඩී. පී. ජේ. දාම්පෙගම මයා | - සාමාජික |
| iv. | ආචාර්ය කේ. ආර්. එම්. යූ. බණ්ඩාර මයා | - සාමාජික |
| v. | සී. ද එස්. ගුණතිලක මයා | - සාමාජික |
| vi. | කේ. ඒ. එම්. ද අල්විස් මයා | - සාමාජික |
| vii. | ඩී. ඩී. වයි. අබේවර්ධන මයා | - සාමාජික |
| viii. | තිමාලි ද සිල්වා මෙනවිය | - නිරික්ෂක/භාණ්ඩාගාර නියෝජිත |

**සමාලෝචනයට භාජනය වූ කාල පරිච්ඡේදය සඳහා වූ ඉඩම් මැනුම් සභා සාමාජිකයන්:**

| | | |
|---|---|---|
| i | එස්.එම්.ඩබ්.ප්‍රනාන්දු මයා (සභාපති) - | 2009-02-03 සිට 2013-07-24 දක්වා |
| ii | ආචාර්ය කේ.තවලිංගම් මයා (උප සභාපති) - | 2009-02-03 සිට 2013-07-24 දක්වා |
| iii | ආචාර්ය කේ.තවලිංගම් මයා (සභාපති) - | 2013-07-25 සිට සමාලෝචිත කාලය තුළ |
| iv | කේ.ඩබ්ලිව්.එන්.ඩී. කරුණාරත්න මයා (උප සභාපති) - | 2013-07-25 සිට 2013-12-02 දක්වා |
| v | නිහාල් ගුණවර්ධන මයා (උප සභාපති) - | 2013-12-03 සිට සමාලෝචිත කාලය තුළ |
| vi | ඩබ්.ඒ.එස්. වික්‍රමාරච්චි මයා (සාමාජික) - | 2011-07-19 සිට 2013-07-24 දක්වා |
| vii | එස්. ඩී. පී. ජේ. දාම්පෙගම මයා (සාමාජික) - | 2013-07-25 සිට සමාලෝචිත කාලය තුළ |
| viii | ආචාර්ය කේ. ආර්. එම්. යූ. බණ්ඩාර මයා (සාමාජික) - | 2012-01-01 සිට සමාලෝචිත කාලය තුළ |
| ix | සී. ද එස්. ගුණතිලක මයා (සාමාජික) - | 2012-01-01 සිට සමාලෝචිත කාලය තුළ |
| x | කේ. ඒ. එම්. ද අල්විස් මයා (සාමාජික) - | 2012-01-01 සිට සමාලෝචිත කාලය තුළ |
| xi | ජෙරල්ඩ් ඒ ද සිල්වා මයා (සාමාජික) - | 2012-01-01 සිට 2013-09-28 දක්වා |
| xii | ඩී. ඩී. වයි. අබේවර්ධන මයා (සාමාජික) - | 2013-10-25 සිට සමාලෝචිත කාලය තුළ |
| xiii | තිමාලි ද සිල්වා මෙනවිය /(භාණ්ඩාගාර නියෝජිත) - | 2010-09-27 සිට සමාලෝචිත කාලය තුළ |

**මැනුම් සභා රැස්වීම් වාර සඳහා සහභාගීත්වය:**

| | | | |
|---|---|---|---|
| i. | එස්.එම්.ඩබ්.ප්‍රනාන්දු මයා | - සභාපති | - රැස්වීම් වාර 11 |
| ii. | ආචාර්ය කේ.තවලිංගම් මයා | - උප සභාපති | - රැස්වීම් වාර 11 |
| iii. | ආචාර්ය කේ.තවලිංගම් මයා | - සභාපති | - රැස්වීම් වාර 05 |
| iv. | කේ. ඩබ්ලිව්. එන්. ඩී. කරුණාරත්න මයා | - උප සභාපති | - රැස්වීම් වාර 04 |
| v. | නිහාල් ගුණවර්ධන මයා | - උප සභාපති | - රැස්වීම් වාර 01 |
| vi. | ඩබ්.ඒ.එස්. වික්රමාරච්චි මයා | - සාමාජික | - රැස්වීම් වාර 10 |
| vii. | එස්. ඩී. පී. ජේ. දාම්පෙගම මයා | - සාමාජික | - රැස්වීම් වාර 05 |
| viii. | ආචාර්ය කේ. ආර්. එම්. යූ. බණ්ඩාර මයා | - සාමාජික | - රැස්වීම් වාර 16 |
| ix. | සී. ද එස්. ගුණතිලක මයා | - සාමාජික | - රැස්වීම් වාර 14 |
| x. | කේ. ඒ. එම්. ද අල්විස් මයා | - සාමාජික | - රැස්වීම් වාර 16 |
| xi. | ජෙරල්ඩ් ඒ ද සිල්වා මයා | - සාමාජික | - රැස්වීම් වාර 09 |
| xii. | ඩී. ඩී. වයි. අබේවර්ධන මයා | - සාමාජික | - -- |
| xiii. | තිමාලි ද සිල්වා මෙනවිය - | භාණ්ඩාගාර නියෝජිත | - රැස්වීම් වාර 13 |

## 06 ඉඩම් මැනුම් සහා කාර්ය මණ්ඩලය:

| | | |
|---|---|---|
| i | ජී.ඩී.එස්.කේ.ගුණරත්න මයා - ලේකම් (වැ.බ.) | - 2009-01-01 සිට මේ දක්වා |
| ii | රංජිත් මහකුඹුර මයා - ගණකාධිකාරි (අර්ධ කාලීන පදනම මත) | - 2008-03-01 සිට මේ දක්වා |
| iii | ඩබ්.ඒ.එස්.ප්‍රියදර්ශනී මෙනවිය පරිගණක යෙදවුම් සහකාර සහ ලිපිකරු | - 2004-05-24 සිට මේ දක්වා |
| iv | පී. සී. ලියනගේ මයා පරිගණක යෙදවුම් සහකාර සහ ලිපිකරු | - 2012-03-16 සිට 2013-02-28 දක්වා |
| v | ආර්. එම්. එන්. රත්නායක මිය පරිගණක යෙදවුම් සහකාර සහ ලිපිකරු | - 2013-03-18 සිට මේ දක්වා |
| vi | ටී.ජී.ප්‍රනාන්දු මයා - කාර්යාල කාර්ය සහායක | - 2004-07-15 සිට මේ දක්වා |

## 07 කාර්යයන්


**ලියාපදිංචිය:**

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ මිනින්දෝරුවන් 61 දෙනෙකු අලුතින් ලියාපදිංචි වී ඇති අතර 2013-12-31 වන දිනට ලියාපදිංචි වු මුළු මිනින්දෝරුවරුන්ගේ ගණන 1975 කි. මෙම මිනින්දෝරුවන් සඳහා ලියාපදිංචි සහතික ලබා දී ඇත.

**වාර්ෂික වෘත්තියේ යෙදීමේ බලපත්‍ර:**

වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ සංඛ්‍යාව සමාලෝචිත කාල පරිච්ජේදයේදී 1077 කි. 2012 වර්ෂයේදී ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා ගේ අනුමැතිය පරිදි රජයේ මිනින්දෝරුවරුන්ට වාර්ෂික බලපත්‍රය ලබාදුන් අතර පසුව කොළඹ දිස්ත්‍රික් අධිකරණයෙන් නිකුත් කල අත්හිටුවීමේ නියෝගයක් නිසා රජයේ මිනින්දෝරුවරුන්ට වාර්ෂික බලපත්‍ර ලබාදීම අත්හිටුවන ලදී. මේ හේතුව නිසා 2013 වර්ෂයේදී ලබාදුන් බලපත්‍ර සංඛ්‍යාව 2012 වර්ෂයට සාපේක්ෂව අඩුවීමක් සිදුවී ඇත.

**2012/2013 වසර තුළ නිකුත් කරනු ලැබු මුළු බලපත්‍ර සංඛ්‍යාව**



2013 ජනවාරි මස 31 වන දින වනවිට වාර්ෂික මැනුම් බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මුලකුරු සමග නම්, ලියාපදිංචි අංක සහ ජාතික හැඳුනුම්පත් අංක සමග 2013 මාර්තු 28 දින පල වූ අංක 1804 දරණ ගැසට් පත්‍රයේ විධිමත් ලෙස ප්‍රසිද්ධියට පත් කරනු ලැබීය.


සියලුම බලයලත් මිනින්දෝරුවරුන්ගේ විස්තර - ලියාපදිංචි අංක, මුලකුරු සමග නම්, ජාතික හැඳුනුම්පත් අංක, දිස්ත්‍රික්කයේ නම, ලිපිනයන්, දුරකථන අංක, වාර්ෂික බලපත්‍රයේ අංකය, බලපත්‍රය වලංගු කාලය ඇතුළත් තොරතුරු www.survey.gov.lk යන වෙබ් අඩවියට ඇතුළත් කරනු ලැබ ඇත. එහි සඳහන් තොරතුරු සෑම මාස තුනකට වරක් යාවත්කාලීන කෙරේ.

## මහජනතාව සඳහා තොරතුරු

මහජනතාව, ඉඩම් මැනුම් සභාව විසින් සපයන සේවාවන් පිළිබඳව දැනුවත් වී සිටින බැවින් බලයලත් මිනින්දෝරුවරුන් විසින් වසර සියයකට පමන පෙර සිට සකසන ලද මුල් මැනුම් පිඹුරුවල පිටපත් ලබා ගැනිම සඳහා බලයලත් මිනින්දෝරුවරුන් ජීවත්ව සිටිනවාද, මියගොස්ද යන තොරතුරු ලබාගැනීමට නිතරම සභය පතයි. එවැනි තොරතුරු අප්‍රමාදව සැපයීමේ අදහස ඇතිව බලයලත් මිනින්දෝරුවරුන්ගේ අදාල පුද්ගලික ලිපිනයන්, ලියාපදිංචි අංක හා බලපත්‍ර අංක වලින් තොරතුරු අන්තර්ගත කිරිම සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සම්පූර්ණ කර ඇත. 2004 වසරට පෙර බලයලත් මිනින්දෝරුවරුන් පිළියෙල කළ මුල් පිඹුරු පිටපත් ලබාගැනිමට උදව් විය හැකි පුද්ගලයින් සමග සම්බන්ධවීමට මහජනතාවට ප්‍රවේශ වියහැකි හැකිවන පරිදි ඔවුන්ගේ දුරකථන අංකද ඇතුලත්කර මෙය යාවත්කාලීන කරනු ලැබේ. එසේ වුවත්, මේ වනතුරු පිඹුරු ක්‍රමානුකූලව ඔවුන්ට ලබා ගැනිමට පූර්ණ වශයෙන්ම සහාය වීමට නොහැකිවීම නිසා මෙම සේවාවන් පිළිබඳව ඉඩම් මැනුම් සභාව සෑහීමකට පත් නොවේ. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ එවැනි විමසීම් 134 ක් සිදුකර තිබේ.

## ඉඩම් මැනුම් සභාවට මහජනතාවගෙන් ලැබී ඇති පැමිණිලි:

**නිරාකරණය කරන ලද මුළු පැමිණිලි සංඛ්‍යාව**




වෘත්තීය විෂමාචාරයේ යෙදී ඇති බවට චෝදනා ලබා ඇති බලයලත් මිනින්දෝරුවරුන් සම්බන්ධව පැමිණිලි 56 ක් 2013 වසර තුළදී මහජනයාගෙන් ලැබී තිබිණි. ඒ සම්බන්ධව මුලික විමර්ශන 11 ක් ඉඩම් මැනුම් සභාව සිදු කළ අතර අවශ්‍ය අවස්ථාවලදී ඉඩම් මැනුම් සභාවේ තීරණය පරිදි, විධිමත් පරීක්ෂණද සිදු කරනු ලැබීය.

මෙලෙස සමාලෝචිත වසර තුළදී විධිමත් පරීක්ෂණ 25 ක් පවත්වන ලදී. 2013 වසර තුළදී, එවැනි පැමිණිලි 50ක කාර්යයන් අවසන් කළ හැකි වූ අතර වසර අවසාන වන විට පැමිණිලි 24 ක් පමණක් නොවිසඳී පැවතුණි.

කෙසේ වුවත්, සමහර පැමිණිලි 2002 අංක 17 දරන මැනුම් පනතේ විධිවිධාන අනුව ඉඩම් මැනුම් සභාවේ විෂය පථයට නොගැනෙන බැවින්ද, සමහර පැමිණිලි අධිකරණයේ නියෝග මත ගරු අධිකරණයේ ලියාපදිංචි උසාවි කොමසාරිස්වරයෙකු වශයෙන් කරන ලද මැනීම් සම්බන්ධයෙන් බැවින්ද, සමහර පැමිණිලි ගරු අධිකරණයේ විභාග කරමින් පවතින නඩුවක් සම්බන්ධයෙන් බැවින්ද, සමහර පැමිණිලි සනාථ කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නොතිබූ බැවින්ද, එම පැමිණිලි සම්බන්ධයෙන් පැමිණිලිකරුවන්ට සහනයක් සැලසීමට ඉඩම් මැනුම් සභාවට නොහැකි විය.

2002 අංක 17 මැනුම් පනතේ විධිවිධාන පරිදි පහත සටහනේ දැක්වෙන මිනින්දෝරුවරුන්ගේ බලපත්‍ර අත්හිටුවන ලදී.

| ගොනුව | ලියාපදිංචි අංකය | මිනින්දෝරුවරයාගේ සම්පූර්ණ නම | බලපත්‍රය අත්හිටුවන ලද කාලය |
|---|---|---|---|
| LSC/5/572 | 19920616 | පින්වා හේවගේ මහින්ද ලාල් ප්‍රේමචන්ද්‍ර | 2013-04-01 සිට 2013-06-30 දක්වා |
| LSC/5/564 | 20040849 | සත්තම්බිරල්ලාගේ දොන් ජෝෂප් ගාමිණී දයා අර්සකුලරත්න | 2013-06-01 සිට 2014-05-31 දක්වා |
| LSC/5/591 | 19900996 | පෙරුම්බඩගේ ඉන්ද්‍රානි මල්ලිකා | 2013-09-01 සිට 2013-11-30 දක්වා |
| LSC/5/534 | 19941060 | කාලිදාස වෛනා සාම්රාජා කන්දනාදන් වික්නරාජා | 2013-09-01 සිට 2013-11-30 දක්වා |
| LSC/5/605 | 19830290 | තුවාන් නූර් සිංග ලක්ෂාණ | 2014-01-01 සිට 2014-12-31 දක්වා |

# 08 අධ්‍යාපන හා පුහුණු

## <u>අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා</u>

අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ඉඩම් මැනීමේ ප්‍රධාන අංගයකි. ඉඩම් මැනුම් සභාව මේ පිළිබඳව දැනුවත්ව සිටින බැවින් මැනුම් වෘත්තිකයින් විසින් ඉඩම් මැනුම් ක්ෂේත්‍රයට හඳුන්වාදුන් නව තාක්ෂණයේ වර්තමාන සංවර්ධනයට අනුරූපවන්නාවූ පුහුණු පාඨමාලා හැදෑරීමට ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් ධෛර්යමත් කර ඇත.

## ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම් මගින් පවත්වනු ලබන අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා (CPD)

ඉඩම් මැනුම් සභාවේ මග පෙන්වීම යටතේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය ලබාගැනීමේ අදහස ඇතිව ලියාපදිංචි මිනින්දෝරුවරුන්ට සහ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ට අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීමට බලවත් උනන්දුවක් දැක්වූ ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම් (ගම්පහ සහ මහනුවර) යන ආයතන හතර පිළිබඳව ඉඩම් මැනුම් සභාව සතුටින් සඳහන් කරයි. එම පාඨමාලා සියල්ල අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා ලෙස ඉඩම් මැනුම් සභාව විසින් පිළිගන්නා ලදී.

## මුල්වරට බලපත්‍ර ලබාගත් මිනින්දෝරුවරුන් සඳහා වූ වැඩමුළුව (අභිමුඛ වැඩමුළුව)


තම ජීවිත ගමන වෘත්තීය මිනින්දෝරුවරයකු ලෙස ආරම්භ කිරීම සඳහා ප්‍රථම වතාවට ඉඩම් මැනුම් සභාවෙන් වාර්ෂික වෘත්තියේ යෙදීමේ බලපත්‍රය ලබාගෙන සිටින මිනින්දෝරුවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පෙරවර්ෂවලදී මෙන්ම 2013-06-28 දිනදී අභිමුඛ වැඩමුළුවක් පවත්වනු ලැබිය. පුළුල් අත්දැකීම් සහිත, විශිෂ්ඨ හැකියාවන්ගෙන් යුත් ප්‍රකට ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්වූ සම්පත්දායිකයින් එකී ලියාපදිංචි මිනින්දෝරුවරුන් දැනුවත් කිරිම සඳහා තෝරාගනු ලැබීය.

**පැවැත්වූ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ සාරාංශය**

| | ආයතනයේ නම | අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලාවේ නම් | පාඨමාලාව පැවැත්වූ දිනය |
|---|---|---|---|
| 1. | ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය | ඉංජිනේරු සහ ඉදිකිරීම් මැනුම්, සහාධිපත්‍ය මැනුම් | 2013-02-22 |
| 2. | ඉඩම් මැනුම් සභාව | තාක්‍ෂණික වැඩමුළුව | 2013-03-06 |
| 3. | ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය | සහාධිපත්‍ය මැනුම්, ඛණ්ඩාංක පද්ධති සහ පරිවර්තන | 2013-03-13 |
| 4. | ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව | වැඩමුළුව | 2013-04-19 |
| 5. | ගම්පහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | සහාධිපත්‍ය නීතිය සහ මැනුම් වෘත්තිය | 2013-05-21 |
| 6. | ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය | හිමිකම් ලියාපදිංචි කිරීමේ මැනුම් සහ බිම් සවිය වැඩසටහන යටතේ කෙරෙන පසුකාලීන මැනුම් | 2013-06-07 |
| 7. | ඉඩම් මැනුම් සභාව | අභිමුඛ වැඩමුළුව | 2013-06-28 |
| 8. | ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය | "ජාතික සංවර්ධනයේ පුරෝගාමියා වෘත්තීයමය මිනින්දෝරුවරායි" යන තේමාව යටතේ තාක්‍ෂණික සැසිය | 2013-08-02 |
| 9. | මහනුවර දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගමය | ඉඩම් නීතිය සහ දේපළ තක්සේරු කිරීම | 2013-09-29 |
| 10. | ඉඩම් මැනුම් සභාව | තාක්‍ෂණික වැඩමුළුව | 2013-11-11 |
| 11. | ඉඩම් මැනුම් සභාව | දුරස්ථ අධ්‍යාපන වැඩමුළුව | 2013 වර්ෂය |

## 09 මූල්‍ය මෙහෙයුම් සමාලෝචනය

**මුළු ආදායම - 2012 / 2013**




රුපියල් 4,660,100 ක් වූ පෙර වර්ෂයේ ජනනය කරන ලද ආදායමට සාපේක්ෂව ඉඩම් මැනුම් සභාවේ මුළු ආදායම රු. 4,583,594 ක් වේ. පෙර වර්ෂයේදී රජයේ මිනින්දෝරුවරුන් සඳහාද බලපත්‍ර ලබාදුන් අතර පසුව ඊට එරෙහිව බලයලත් මිනින්දෝරුවරුන් විසින් ගරු අධිකරණයේ ගොනුකරන ලද නඩුවක් නිසා එම ක්‍රමවේදයට ගරු අධිකරණය විසින් තහනම් නියෝගයක් පනවන ලදී. මේ හේතුව නිසා ප්‍රධාන වශයෙන් 2013 වසරට සාපේක්ෂව 2014 වසරෙහිදී ආදායමෙහි අඩුවීමක් දක්නට ඇත.

එමෙන්ම අදාළ කාල පරිච්ඡේදය තුළ සභාවේ වියදම රු. 3,532,281 ක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රු. 1,051,313 ක අතිරික්තයක් පැවතිණ.

2010, 2011 සහ 2012 වර්ෂවලදී මෙන්ම 2013 වර්ෂය සඳහාද මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් සපයා නොමැත. 2013 වසර සඳහා ප්‍රාග්ධන වියදම් රු. 238,053 ක් විය.

## 10 අරමුදල් සහ මූල්‍ය කළමනාකරණය

ඉඩම් මැනුම් සභාවේ ආදායම ප්‍රධාන වශයෙන්, වාර්ෂික වෘත්තියේ යෙදීමේ බලපත්‍ර ගාස්තු, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා පැවැත්වීම සඳහා අය කිරීම් සහ විධිමත් පරීක්ෂණ පැවැත්වීමට දැරූ වියදම වැරදිකරුවන්වූ ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් අයකර ගැනීම් මගින් රැස් කෙරේ.

2013-12-31 වන දිනට රුපියල් 9,824,461 ක මුදලක් ලංකා බැංකුවේ ස්ථාවර ගිණුම්වල තැන්පත් කර ඇත.

**11**

# 2013 වර්ෂය සඳහා වූ අවසන් ගිණුම්

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**
**ඉඩම් මැනුම් සභාව**

# 2013 දෙසැම්බර් 31 වන දිනට
# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| විස්තරය | Notes | 2013 | | 2012 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 1 | 8,518,410 | | 7,789,377 | |
| ලැබිය යුතු දෑ | 2 | 189,376 | | 101,363 | |
| ආපදා ණය | | 292,527 | | 395,051 | |
| උත්සව අත්තිකාරම් | | 2,000 | 9,002,313 | 2,000 | 8,287,791 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| ස්ථාවර තැන්පතු | 3 | 1,325,249 | | 1,177,999 | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 4 | 523,610 | | 412,861 | |
| | | | 1,848,859 | | 1,590,860 |
| **මුළු වත්කම්** | | | 10,851,172 | | 9,878,651 |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| කලින් ලැබී ඇති බලපත්‍ර ගාස්තු | | 2,481,275 | | 2541650 | |
| ගෙවිය යුතු දෑ | | 248,000 | | 250,250 | |
| උපචිත වියදම් | 5 | 279,536 | | 295,703 | 3,087,603 |
| **ජංගම නොවන වගකීම්** | | | - | | - |
| **මුළු වගකීම්** | | | 3,008,811 | | 3,087,603 |
| **ශුද්ධ වත්කම්** | | | **7,842,361** | | **6,791,048** |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | | | |
| ප්‍රාග්ධන සැපයුම | | | | | |
| මහා භාණ්ඩාගාරය | | 1,043,030 | | 1,043,030 | |
| සමුච්චිත අරමුදල | | 5,748,018 | | 4,318,445 | |
| අතිරික්තය/හිඟය | | 1,051,313 | | 1429573 | |
| **මුළු ශුද්ධ වත්කම්/හිමිකම්** | | | **7,842,361** | | **6,791,048** |

එස්. එම්. පී. පී. සංගක්කාර
උප සභාපති

පී. එම්. පී. උදයකාන්ත
සභාපති

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**
**ඉඩම් මැනුම් සභාව**

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය කාර්යසාධනය

| විස්තරය | සටහන | 2013 | | 2012 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **ආදායම්** | | | | | |
| බලපත්‍ර ගාස්තුව | | 2,636,150 | | 3,314,530 | |
| ලියාපදිංචි ගාස්තුව | | 272,500 | | 199,500 | |
| වෙනත් ආදායම් | 6 | 1,674,944 | | 1,146,070 | |
| මුළු ආදායම | | | 4,583,594 | | 4,660,100 |
| **වියදම්** | | | | | |
| **පෞද්ගලික පඩිනඩි** | | | | | |
| වැටුප් හා වේතන | 7 | 808,897 | | 802,122 | |
| අතිකාල හා නිවාඩු දින දීමනා | | 11,092 | | - | |
| වෙනත් දීමනා | 8 | 1,065,266 | (1,885,255) | 1,003,329 | (1,805,451) |
| **ගමන් වියදම්** | | | | | |
| දේශීය | | | (6,372) | | (8,532) |
| **සැපයුම්** | | | | | |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | | 102,656 | | 131,364 | |
| වෙනත් | | 51,830 | (154,486) | 41,119 | (172,483) |
| **නඩත්තු වියදම්** | | | | | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | | | (21,280) | | (9,500) |
| **සේවා** | | | | | |
| තැපැල් හා සන්නිවේදන | | 127,957 | | 108,976 | |
| විදුලිය හා ජලය | 9 | 78,734 | | 78,734 | |
| වෙනත් | 10 | 1,130,893 | (1,337,584) | 956,818 | (1,144,528) |
| ක්ෂයවීම | | | (127,304) | | (90,033) |
| මුළු වියදම් | | | (3,532,281) | | (3,230,527) |
| **කාලසීමාවට අදාල අතිරික්තය/ඌනතාව** | | | **1,051,313** | | **1,429,573** |

එස්. එම්. පී. පී. සංගක්කාර
උප සභාපති
ඉඩම් මැනුම් සභාව

පී. එම්. පී. උදයකාන්ත
සභාපති
ඉඩම් මැනුම් සභාව

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**
**ඉඩම් මැනුම් සභාව**

# 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය

| විස්තරය | ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්චිත අරමුදල/ඌනතාවය | එකතුව |
|---|---|---|---|
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 5,748,018 | 6,791,048 |
| කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/හිඟය | | 1,051,313 | 1,051,313 |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,043,030 | 6,799,331 | 7,842,361 |

එස්. එම්. පී. පී. සංගක්කාර
උප සභාපති
ඉඩම් මැනුම් සභාව

පී. එම්. පී. උදයකාන්ත
සභාපති
ඉඩම් මැනුම් සභාව

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**
**ඉඩම් මැනුම් සභාව**

# 2013 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | සටහන | 2013 | | 2012 | |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල්ප්‍රවාහ** | | | | | |
| අතිරික්තය/(ඌනතාවය) | | 1,051,313 | | 1,429,573 | |
| **මුදල් නොවන සංචලනයන්** | | | | | |
| ක්ෂයවීම | | 127,304 | | 90,033 | |
| ස්ථාවර තැන්පතු පොළිය | | (894,288) | | (732,907) | |
| ආපදා ණය (වැඩිවීම)/අඩුවීම | | 102,524 | | (132,931) | |
| ලැබිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | (88,013) | | 65,154 | |
| ගෙවිය යුතු දෑ (වැඩිවීම)/අඩුවීම | | (2,250) | | 46,250 | |
| කලින් ලැබුණ බලපත්‍ර ගාස්තුව වැඩිවීම/(අඩුවීම) | | (60,375) | | (51,780) | |
| උපචිත වියදමෙහි වැඩිවීම/(අඩුවීම) | | (16,167) | | 122,960 | |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | 220,048 | | 836,352 |
| **ආයෝජන කටයුතු වලින් ජනනය වූ මුදල් පුවාහ** | | | | | |
| ස්ථාවර තැන්පතු | | (147,250) | | 115,729 | |
| ස්ථාවර තැන්පතු පොලිය | | 894,288 | | 732,907 | |
| ස්ථාවර වත්කම් මිළදී ගැනීම | | (238,053) | | (85,000) | |
| **මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | | 508,985 | | 763,636 |
| **මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | | | | |
| | | | | | (25,760) |
| මුදල් හා මුදල් සමාන දෑ වල දළ වැඩිවීම /(අඩුවීම) | | | 729,033 | | 1,574,228 |
| කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල් සමාන දේ | | | 7,789,377 | | 6,215,149 |
| කාලසීමාව අවසානයේ මුදල් හා මුදල් සමානදේ | 1 | | 8,518,410 | | 7,789,377 |

එස්. එම්. පී. පී. සංගක්කාර
උප සභාපති
ඉඩම් මැනුම් සභාව

පී. එම්. පී. උදයකාන්ත
සභාපති
ඉඩම් මැනුම් සභාව

## ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
## ඉඩම් මැනුම් සභාව

**1 මුදල් හා මුදල් සමාන දෑ**

| | | | | | |
|---|---|---|---|---|---|
| | අතැති මුදල | | | | 3,081 |
| | බැංකුවේ ඇති මුදල | | | | 16,117 |
| ස්ථාවර තැන්පතු | | | | | |
| අනු අංකය | බැංකුව | Period | Account No. | Value | |
| 1 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 1 | 7256887 | 2,000,000 | |
| 2 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 2 | 70070797 | 2,064,001 | |
| 3 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 3 | 74176142 | 1,635,211 | |
| 4 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 4 | 75333664 | 1,000,000 | |
| 5 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 5 | 75333588 | 500,000 | |
| 6 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | මාස 6 | 75028364 | 700,000 | |
| 7 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | දින 7 | 75410060 | 300,000 | |
| 8 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | දින 7 | 75410146 | 300,000 | |
| | | | | | 8,499,212 |
| | | | | | 8,518,410 |

**2 ලැබිය යුතු දෑ**

| | | |
|---|---|---|
| ලැබිය යුතු පොලී ආදායම | 137,308 | |
| පී. සී. ලියනගේ මයාගෙන් ලැබිය යුතු දඩ මුදල | 22,068 | |
| අත්හිටවූ බලපත්‍ර සඳහා ලැබිය යුතු දඩ මුදල | 30,000 | |
| | | 189,379 |

**3 Fixed Deposits**

| අනු අංකය | බැංකුව | ගිණුම් අංකය | | වටිනාකම |
|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව, නාරාහෙන්පිට | වසර 1 | 71352120 | 1,325,249 |
| | | | | 1,325,249 |

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව

**4 - යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ**

| අයිතම | 2013-01-01 දිනට ශේෂය රු. | වර්ෂය තුළදී මිළදී ගැනීම රු. | එකතුව රු. | ක්ෂය වීම % | වාර්ෂික ක්ෂයවීම රු. | 2013-12-31 දිනට ශුද්ධ වටිනාකම |
|---|---|---|---|---|---|---|
| යන්ත්‍රෝපකරණ | 129,449 | - | 129,449 | 20 | 25,890 | ***103,559*** |
| ගෘහභාණ්ඩ | 165,601 | - | 165,601 | 10 | 16,560 | ***149,041*** |
| පරිගණක | 106,839 | 127248 | 234,087 | 25 | 58,522 | ***175,565*** |
| කාර්යාලීය උපකරණ | 10,972 | 28553 | 39,525 | 25 | 9,882 | ***29,643*** |
| LSC නාම පුවරුව | - | 82252 | 82252 | 20 | 16450 | **65802** |
| එකතුව | **412,861** | **238,053** | **650,914** | | **127,304** | **523,610** |

**5** **උපචිත වියදම්**

| අනු අංකය. | වියදම් | රු. |
|---|---|---|
| 1 | වැටුප් සහ වේතන | 9,000 |
| 2 | සාමාජික දීමනා | 72,670 |
| 3 | දුරකතන | 3,516 |
| 4 | දුරකතන සහ තැපැල් ගාස්තු | 1,170 |
| 5 | අතිකාල දීමනා | 4,350 |
| 6 | විගණන ගාස්තු | 190,000 |
| **එකතුව** | | **279,536** |

**6** **වෙනත් ආදායම්**

| | |
|---|---|
| තොරතුරු නිකුත් කිරීම සඳහා අයකිරීම් | 23,800 |
| අභිමුඛ වැඩමුළු සඳහා පාඨමාලා ගාස්තු | 696,570 |
| ස්ථාවර තැන්පතු සඳහා පොළිය | 889,739 |
| සේවක ණය පොළිය | 12,767 |
| පී. සී. ලියනගේ මයාගෙන් ලද මුදල | 22,068 |
| අත්හිටවූ බලපත්‍ර සඳහා ලද දඩ මුදල | 30,000 |
| | **1,674,944** |

**7** **වැටුප් හා වේතන**

| | |
|---|---|
| වැටුප් හා වේතන | 670,897 |
| සේවක අර්ථසාධක අරමුදලේ දායකත්ව මුදල | 110,400 |
| සේවක භාරකාරත්ව අරමුදලේ දායකත්ව මුදල | 27,600 |
| | **808,897** |

**8** **වෙනත් දීමනා**

| | |
|---|---|
| ජීවන වියදම් දීමනා | 233,981 |
| විශේෂ දීමනා | 102,374 |
| සභාපතිගේ කාර්ය දීමනා | 300,000 |
| උප සභාපතිගේ කාර්ය දීමනා | 244,516 |
| වැඩබලන ලේකම්වරයාගේ කාර්ය දීමනා | 115,590 |
| ගණකාධිකාරිගේ කාර්ය දීමනා | 68,805 |
| | **1,065,266** |

**සැපයුම්**

**9** **විදුලිය හා ජලය**

| | |
|---|---|
| විදුලිය | 74,534 |
| ජලය | 4,200 |
| | **78,734** |

**10** **වෙනත්**

| | |
|---|---|
| මැනුම් සහා සාමාජිකයන්ගේ දීමනා | 446,438 |
| විගණන කමිටු සාමාජිකයන්ගේ දීමනා | 112,000 |
| විගණන ගාස්තු | 96,400 |
| දැන්වීම් | 89,201 |
| වෙනත් | 98,594 |
| වැඩමුළු වියදම් | 266,510 |
| සේවක පුහුණු පාඨමාලා ගාස්තු | 21,750 |
| | **1,130,893** |

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව

2013-12-31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
පොදු ගිණුම් ප්‍රතිපත්ති

1. <u>පොදු ගිණුම් ප්‍රතිපත්ති</u>

1.1. සැකසීමේ පදනම
ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට සහ 1971 අංක.38 දරන මූල්‍ය පනතේ විධිවිධානවලට අනුව මූල්‍ය ප්‍රකාශන සකස්කරනු ලැබේ.

1.2. මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමින් සකස් කොට ඇත.

1.3. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මතය යටතේ සකස් කෙරේ.

**2.** <u>වත්කම් වලට අදාළ ඇගයීම්</u>

2.1. ස්ථාවර වත්කම් කපාහල අගයට දක්වා ඇත.

2.2. ක්ෂය වීම
ස්ථාවර වත්කම් ක්ෂයවීම හීනවන ශේෂ ක්‍රමය යටතේ පසුගිය වර්ෂයට අනුකූලව පහත සඳහන් අනුපාතය මත සපයා ඇත.

| වත්කම් වර්ගය | % |
|---|---|
| යන්ත්‍රෝපකරණ | 20 |
| ගෘහ භාණ්ඩ | 10 |
| පරිගණක | 25 |
| කාර්යාලීය උපකරණ | 25 |
| නාම පුවරුව | 20 |

මගේ අංකය / எனது இல. / My No. } එල්පී/එෆ්/එල්එස්සී/01/13/05 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2014 ඔක්තෝබර් 15 දින

සභාපති
ඉඩම් මැනුම් සභාව

**ඉඩම් මැනුම් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ඉඩම් මැනුම් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 57(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2014 ජුනි 09 දින නිකුත් කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මතය**

-------

2013 දෙසැම්බර් 31 දිනට ඉඩම් මැනුම් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

**2.2.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

---------------------------------------

2012 වර්ෂයේ සේවයට බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී සේවයෙන් ඉවත් වී තිබුණු නිලධාරියෙකුගෙන් අයවියයුතුව තිබූ රු. 117,600 අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද ආදායම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,051,313 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,429,573 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.378,260 ක පිරිහීමක් දක්නට ලැබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වාර්ෂික බලපත්‍ර ආදායමෙහි රු. 678,380 ක අඩුවීම මෙම පිරිහීමට සෘජුවම බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**4.1 කාර්ය සාධනය**

------------------

2002 අංක 17 දරන මැනුම් පනතෙහි සඳහන් කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

ආ) පසුගිය වර්ෂයේ විසඳීමට තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 88 ක් වූ අතර ඉන් 70 ක් එනම් සියයට 80 ක් විසඳා තිබුණද පසුගිය වර්ෂයේ නොවිසඳුන පැමිණිලිත් සමඟ සමාලෝචිත වර්ෂයේ විසඳීමට තිබූ පැමිණිලි 74 න් 50 ක් එනම් සියයට 68 ක් පමණක් විසඳා තිබුණු අතර සමහර මාසවල එක පැමිණිල්ලක්වත් විසඳීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

ආ) මිනින්දෝරු වෘත්තීය වැඩි දියුණු කිරීම සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම මූලික කර්තව්‍යයක් වූ අතර ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුළ සංවර්ධන වැඩසටහන් 05 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී වැඩසටහන් 03 ක් පමණක් පවත්වා තිබුණි. කෙසේ වුවද වෙනත් ආයතන මගින් පවත්වන ලද වැඩසටහන්ද සමඟ වැඩසටහන් 11 ක් පැවැත්වූ බව කාර්යය සාධන වාර්තාවේ දක්වා තිබුණි. වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.696,570 ක මුදලක් බලයලත් මිනින්දෝරුවන්ගෙන් එකතු කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණේ රු.266,510 ක් හෙවත් සියයට 38 ක් පමණක් වූ අතර 2011 හා 2012 වර්ෂයන්හි උපයෝජනය කල අගයන් පිළිවෙලින් සියයට 49 ක් හා සියයට 41 පමණක් විය. මේ අනුව මෙම කර්තව්‍ය ඉටුකිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොමැති බව නිරීක්ෂණය විය.

## 4.2 ආර්ථික නොවූ ගනුදෙනු

වටිනාකම රු. මිලියන 1.5 ක් වූ ස්ථාවර තැන්පතු 2 ක් කල්පිරීමට ප්‍රථම මුදල් කර තිබීම නිසා ඒ සඳහා ලැබිය යුතුව තිබුණු රු. 44,712 ක පොළී මුදල අහිමි වී තිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2008 වර්ෂයේදී ඉදිරිපත් කර තිබුණු පැමිණිල්ලක් වසර 05 ක් ඉක්මවා තිබුණද එය විසඳීමට 2014 මැයි 30 දින දක්වා පියවර ගෙන නොතිබුණි.

# 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අයවැය පාලනය

පහත කරුණු හේතුවෙන් අයවැය ලේඛනය කාර්යක්ෂම පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

අ) වෙනත් වියදම් සඳහා රු. 355,000 ක් ඇස්තමේන්තු කර තිබුණද තථ්‍ය වියදම රු. 1,130,893 ක් වූයෙන් එය ඇස්තමේන්තු කළ වියදමට වඩා සියයට 318 ක වැඩිවීමකි.

ආ) වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන් තුළින් ඇස්තමේන්තු ආදායමෙන් සියයට 1,393 ක ඉපයීමක් සිදුකර තිබුණු අතර අයවැය ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරන අවස්ථාවේ මූලික අරමුණු යටතට ගැනෙන එවැනි කරුණු සම්බන්ධයෙන් අවධානය යොමුකර ප්‍රමාණවත් ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 5.2 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය සහ 2009 ජනවාරි 06 දිනැති අංක ඩීඑම්එස්/ඊ/35/4/391 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව 2009 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පවතින අතර ඒ සඳහා ස්ථිර පදනමින් නිලධාරියෙකු බඳවා ගන්නා තෙක්, අදාළ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති නිලධාරියෙකු වැඩබලන ලේකම්වරයෙකු ලෙස පත් කිරීමට අනුමැතිය දී තිබුණි. ඒ අනුව සභාවේ ලේකම් තනතුර සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු වැඩ බැලීමට පත්කර තිබුණු අතර, ස්ථිර ලේකම් වරයෙකු බඳවා ගන්නා ලෙස 2012 ජූලි 05 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණද එම තනතුර පිරවීමට 2014 මැයි 30 දින දක්වාම කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

**5.3 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

අ) සභාවේ ලියාපදිංචි වී තිබූ මිනින්දෝරුවරයෙකු නම් දෙකක් භාවිතා කරමින් පිඹුරු පිටපත් සකස් කර තිබූ බව විගණන පරික්ෂාවේදී අනාවරණය වූ අතර මේ හේතුවෙන් පිඹුරුපතේ සඳහන් නමට ඉදිරිපත් කරන පැමිණිලි ප්‍රතික්ෂේප වන බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

ආ) 2002 අංක 17 දරන මැනුම් පනතේ 12(1) වගන්තිය හා ඉඩම් මැනුම් සභාවේ 2006 අප්‍රේල් 02 දිනැති අංක LSC/Cir/02/2006 දරන චක්‍රලේඛයට අනුව බලයලත් මිනින්දෝරුවරුන් විසින් යම් බිම් කොටසක හිමිකම් පැවරීම සඳහා හෝ යම් මායිමක් වෙනස් කිරීම සඳහා සකස් කරනු ලබන පිඹුරක් හෝ සිතියමක සහතික පිටපතක් අදාළ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලවල එම පිඹුරු සහතික කරන ලද දිනයේ සිට දින 30 ක් ඇතුළත තැන්පත් කළ යුතු වුවද විගණිත දිනය වූ 2014 මැයි 15 දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනය**

---------------------

පද්ධති හා පාලන සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලද අතර පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළයුතු වේ.

අ) ගණකාධිකරණය
ආ) මුදල් පරිහරණය හා බැංකුගත කිරීම
ඇ) විෂමාචාර සම්බන්ධ පැමිණිලි විසඳීම

එච්.ඒ.එස්.සමරවිර
විගණකාධිපති